# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2281/27 - 2022 මැයි මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2022.05.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය: 3/2/3/10/272.*
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/7/2017/එච් ඩබ්ලිව්/418.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තල්ගස්මොටේ ගමේ අංක 328ඒ, තල්ගස්මොටේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් 2022.04.22 දිනැතිව පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංකය 510610, කලාප අංකය 03, පත්‍ර අංකය 1 හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0391 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස (01).

01. කැබලි අංක 312
ඉඩමේ නම: කෝන්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: කුරුගමගේ ආරියවංශ, අංක 49/2, නිට්ටඹුව පාර, වේයන්ගොඩ (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්: 0.0391.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ජූනි මස 15 වැනි දින පෙ.ව. 10.00 ට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 ජූනි මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එස්. පී. ගුණවර්ධන,**
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරී,
අත්තනගල්ල.

අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05-0123/1

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය: 3/2/3/10/272.*
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/7/2016/ එච්ඩබ්ලිව්/281.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තල්ගස්මොටෙ ගමේ අංක 328ඒ, තල්ගස්මොටෙ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2022.04.22 දිනැතිව පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංකය 510610, කලාප අංකය 03, පත්‍ර අංකය 4 හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0188 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස (02).

01. කැබලි අංක 652
ඉඩමේ නම: කෝන්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: කුරුගමගේ ආරියවංශ, අංක 49/2, නිට්ටඹුව පාර, වේයන්ගොඩ (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්: 0.0169.

01. කැබලි අංක 654
ඉඩමේ නම: කෝන්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: තුඩේවත්තගේ නිමල්සිරි, අංක 76/9, මොට්ටුන්න, වේයන්ගොඩ (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්: 0.0019.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ජුනි මස 15 වැනි දින පෙ.ව. 10.00 ට අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 ජුනි මස 07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**එස්. පී. ගුණවර්ධන,**
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
අත්තනගල්ල.

අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05-0123/2